# 1.36 මහා සම්ප්‍රදායෙන් චූල සම්ප්‍රදායට (ගැමි කබුකි නාට්‍යයේ උද්භවය)

කුලතිලක කුමාරසිංහ

සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

17 වන සියවසේ ප්‍රභවය වූ කබුකි නාට්‍ය කලාව නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යන රංග ශෛලිවල මනා සංකලනයේ ප්‍රතිඵලයකි. ගායනයේ හා නර්තනයේ දක්ෂතාව යන අදහස වර්තමානයේ දී කබුකි යන වචනයෙන් අදහස් කෙරේ. කබුකි යන වචනය ඇසුණු සැණින් අපට මෙනෙහි වන්නේ සුවිසල් හා අපූර්ව නාට්‍ය ශාලාවක රඟ දක්වන සම්භාව්‍ය මහා නාට්‍ය සම්ප්‍රදායයි. වර්තමානය වන විට කබුකි තාක්ෂණයෙන් උපරිම වශයෙන් ආලෝකය ලද රංග විශේෂයක් ලෙස සැලකේ. ඇතැම් කබුකි නාට්‍යවල ප්‍රධාන නළුවා තාක්ෂණයේ පිහිටෙන් ප්‍රේක්ෂකයන් ත්‍රාසයට හා සංත්‍රාසයට පත් කරයි. ඔවුහු විටෙක අහස් කරණම් ගසති; තවත් විටෙක පොළොව යටට ගිලා බසිති; බිම්පත්ලේ සිට ඊයක වේගයෙන් උඩට මතුවෙති; මවරි බූතයි යනුවෙන් හැඳින්වෙන කැරකෙන වේදිකාව ප්‍රේක්ෂකයන් විස්මයට පත්කරවනසුලු ජවනිකා නිරූපණයට උපයෝගී කර ගනිති. සාම්ප්‍රදායික කබුකි වූ කලී අති දූවැන්ත වේදිකා ක්‍රියාවලියකි පසුගිය සියවස තුළ කබුකි නාට්‍ය කලාවට බටහිර වේදිකා නාට්‍යයේ බොහෝ ලක්ෂණ ප්‍රවිෂ්ට වන්නට විය. බටහිර බලපෑම් ඉතා පැහැදිලි ලෙස මෙකල රඟ දැක්වූ කබුකි නාට්‍යවලින් දෘශ්‍යමාන වන්නට වූයේය. බටහිර නාට්‍ය ශාලාවක තිබෙන ආකාරයට බටහිර ශෛලියේ ආසන ඉදිකිරීමට පෙලඹුණි. නාට්‍යාගාර ද පුළුල් කෙරුණි. ගෑස් ලාම්පු වෙනුවට විදුලි ආලෝකය යොදා ගැනුණි. වේදිකා අංගෝපාංග ද නවීකරණය කළේය. එහෙත් කබුකි නාට්‍යවල රඟපෑම හා නිෂ්පාදනය ඒ වන විටත් කිසියම් ස්ථාවරත්වයකට පත් ව තිබූ හෙයින් ඒවායෙහි වෙනස්කම් සිදුකරලීම පහසු නොවීය. රඟපෑම බොහෝ දුරට එදිනෙදා ජීවිතය අනුකරණය කරන තත්වයට ළඟා වූයේය. ඔන්නගත චරිත රංගනය පිළිබඳ යම්යම් ප්‍රශ්න පැන නැගී නිළියන් යොදා ගත යුතු යැයි කල්පනා කළත් කබුකි නාට්‍ය කරුවාට එදෝ යුගයට ආවේණික වූ සාම්ප්‍රදායික ලක්ෂණ ඛණ්ඩනය කිරීම පහසු නොවීය. කබුකි ප්‍රේක්ෂකයෝ ද ඊට එකඟතාවක් නොදක් වූහ. මේ වන විට කබුකි සැලකෙන්නේ සංගීතය නර්තනය හා රංගනය කැටි කර ගත් නාට්‍ය විශේෂයක් ලෙසට ය.

පසුගිය දශක පහකට පමණ පෙර කාලයක සිට සාම්ප්‍රදායික කබුකි රංගනය හා බැඳුණු නීතිරීති හා රංග ක්‍රියාකාරකම් අතික්‍රමණය කරමින් ගැමි ප්‍රේක්ෂකයන් අතර කබුකි ජනප්‍රිය වන්නට විය. මේ කබුකි මුර කබුකි (ගැමි කබුකි ) යනුවෙන් හඳුන්වනු ලැබේ.

වයඹ හා ඊසාන දිග ජපානයේ ඇතැම් පෙදෙස්වල ගැමි කබුකි ප්‍රචලිත ව පවතී. එම පළාත්වල ග්‍රාමීය පෙදෙස් හි කබුකි රංග ශාලා ඉදිකර කෘෂිකාර්මික අස්වැන්න ලබා ගැනීමෙන් පසු . පැරණි කබුකි කතා පුවත් වර්තමාන බසට නගා රඟ දැක්වීමට පෙලෙඹෙති. මේ කාර්යයෙහි වැඩි වශයෙන් යෙදී සිටින්නේ තරුණතරුණියෝය. ගැමි කබුකිවල ස්ත්‍රී චරිත තරුණියන් විසින් ම රඟ දක්වනු ලැබේ. ඇතැම් පුරුෂ චරිත ද තරුණ නිළියන් විසින් රඟ දක්වනු ලබන අවස්ථා දැකිය හැකියි නාට්‍යය ගමේ කබුකි වේදිකාවට ගෙන ඒමට පෙර දිවා රෑ නොබලා නළු නිළියෝ පුහුණු වෙති. ගැමි ප්‍රේක්ෂකයන්ගෙන් මේ ගැන විමසූ විට පැවසූයේ සාම්ප්‍රදායික කබුකි නැරඹීමෙන් ලද නොහැකි ජීවන ආස්වාදයක් විඳ ගැනීමට ඔවුන්ට අවකාශය ලැබෙන බවය. විශාල මුදලක් ගෙවා තාක්ෂණික ආධිපත්‍යයට නතු වූ කබුකි නරඹනවාට වඩා ගැමි කබුකි නැරඹීමෙන් රසඥතාව දියුණු කර ගත හැකි බව ඔවුහු පුනපුනා ප්‍රකාශ කරති. ගැමි කබුකි පිළිබඳ විචාරකයන්ගේ අදහස වන්නේ සාම්ප්‍රදායික කබුකිවල විකාසන අවස්ථාවක් ලෙස එය සැලකිය හැකි බවය. එහෙත් ගැඹුරින් පිරික්සන විට හැඟී යන්නේ ගැමි කබුකි කගුර, කගකු, ගිගකු, බුගකු මෙන් ජන නාට්‍ය විශේෂයක් ලෙස අගය කළ හැකි බවයි.